**බස්නාහිර පළාත් සභාව - 2023 වර්ෂය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බස්නාහිර පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට ආදළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 ජූලි 18 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 05 ක වටිනාකම රු. මිලියන 516 ක් වූ මූල්‍ය නොවන වත්කම් එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබූ අතර ඒ අනුව පළාත් අරමුදලේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම හා දේපළ, පිරියත හා උපකරණ සංචිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රඥප්තිගත ආයතන 09 ක් සතු රු. මිලියන 5,252 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් හා රු. මිලියන 3,201 ක ස්ථාවර තැන්පතු ශේෂයන් පැවතියද එම වටිනාකම් පළාත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | පළාත් සභාවේ ආයතන වුවද පළාත් භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් කිරීමක් සිදු නොකරන නිසා අරමුදල් ගිණුමේ ඇතුළත් නොකරන බව. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අරමුදල් ගිණුම අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු. මිලියන 4,209 ක් වුවද මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ වටිනාකම රු. මිලියන 918 ක් වූයෙන් රු. මිලියන 3291 ක වත්කම් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | Transfer In යටතේ ඇතුළත් කරනු ලබන සියලුම වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන අදාළ ආයතන මගින් නඩත්තු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට නොවිසඳී ඇති නඩු 210 ක් පැවති අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් එම නොවිසඳී ඇති නඩු සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. | පිළිගන්නා බව සහ ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කරන බව. | මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |

## 1.2.1 පොදු නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ 03 කට අයත් වාහන 03 ක් වසර 04 ක කාලයක සිට ජනාධිපති ලේකම් කාර්යාලයට මුදාහැර තිබූ අතර එම වාහන අදාළ අමාත්‍යාංශ වෙත නැවත ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | දිගින් දිගටම ඉල්ලීම් කළ නමුත් ලබා දීමට හැකියාවක් නොමැති බව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දන්වා ඇති බව. | වාහන ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු අමාත්‍යවරුන්ට සහ කාර්යමණ්ඩලයට වෙන්කළ වාහනවලින් රු. මිලියන 62 ක් වටිනාකමැති වාහන 02 ක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් වෙත 2021 මාර්තු මාසයේදී ලබා දී තිබුණ ද නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීගෙන් රථය ලබා දෙන ලෙස ඉල්ලා 2022 මැයි 18 දින ලිපියක් නිකුත් කර ඇති බව. | - එම - |
| (ඇ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 19 ක සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අලාභහානි වටිනාකම රු. මිලියන 72 ක් වුවද මූල්‍ය රීති 54 ප්‍රකාරව එම වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වසර 5 ත් වසර 10 ත් අතර රු. මිලියන 7 ක අලාභ හානි හා වසර 10 ට වැඩි රු. මිලියන 5 ක අලාභ හානි මේ අතර පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අලාභහානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ආදායම් සංකේත 30 ක් යටතේ ආදායම් රැස්කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එයින් ආදායම් සංකේත 18 කට අදාළව රු. මිලියන 13,400 ක හිඟ ආදායමක් පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ දෙකකට වඩා ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතු වුවත් රු. මිලියන 58 ක් වටිනා ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් අවසන් නොකළ ව්‍යාපෘති පවතින නිසා එම තැන්පතු තවදුරටත් පවතින බව. | ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රඥප්තිගත ආයතන 06 ක සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 1,781 ක ලැබිය යුතු ශේෂ පැවතුණ අතර, අවුරුදු 5 ට වැඩි ලැබිය යුතු ශේෂවල වටිනාකම රු. මිලියන 1,108 ක් විය. | ව්‍යවස්ථාපිත ආයතනවල ලැබිය යුතු ශේෂ පළාත් භාණ්ඩාගාරය විසින් ඍජු නියාමනයක් සිදු නොකරන බව. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 100 - ආණ්ඩුකාරවරයා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන හා ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාර ගරු ආණ්ඩුකාරවරුන්ගේ පරිහරණය වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 02 ක් හා අවශ්‍ය වන්නේ නම් ආරක්ෂක කටයුතු වෙනුවෙන් එක් ආරක්ෂක රථයක්ද හිමි වුවත්, බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාට ආරක්ෂක රථයක්ද ඇතුළුව නිල වාහන 04 ක් වෙන්කරදී පරිහරණයට යොදවා තිබුණි. | ඉන්ධන ලබා දෙන්නේ වාහන 03 ක් සඳහා පමණක් බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 මාර්තු 29 දිනැති අංක PS/PCMD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා තීරණය කිරීමේදී ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. නමුත් ආණ්ඩුකාරවර කාර්යාලයේ කමිටු 03 ක් සඳහා ආණ්ඩුකාර අනුමැතිය මත පමණක් දීමනා අනුමත කර ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද රාජකාරි දිනවල දිනකට පැය 1- 2 ½ අතර වූ උපරිම කාලයකට පැවැත්වෙන කමිටු සඳහා එකී නිලධාරීන්ගේ දිනක නිවාඩු දින වැටුප වන 1/20 ඉක්මවා දීමනා මුදල් තීරණය කර තිබුණි. | පැවරී ඇති සාමාන්‍ය රාජකාරී විෂයන්ට අමතරව ඉටු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් ගෙවා ඇති බව. | - එම - |
| (ඇ) | කිසිදු චක්‍රලේඛයකින් ප්‍රතිපාදන සලසාදී නොතිබුණද 2019 වර්ෂයේ මැයි මස සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ආණ්ඩුකාර නිල නිවස පරිහරණය කළ ආණ්ඩුකාරවරුන් විසින් පරිභෝජනය කළ විදුලි හා ජල ඒකක ප්‍රමාණය අනුව ඔවුන් විසින් ගෙවිය යුතු රු. මිලියන 2 ක විදුලි බිල්පත් හා රු.337,647 ක ජල බිල්පත් ආණ්ඩුකාර කාර්යාලය විසින් ගෙවා තිබුණි. | මීට ඉහත කිසිදු ධූරධාරියෙකුගෙන් හා ගරු ආණ්ඩුකාරවරුන්ගෙන් අය කර නොමැති බව. | නිල නිවාස පරිහරණය කරන නිලධාරීන්ගෙන් ජල හා විදුලි බිල්පත්වල වටිනාකම් අය කළ යුතුය. |
| (ඇ) | ආණ්ඩුකාරවරයා වෙත මෝටර් කාර් / ජීප් රථයක් සියලුම බදු ඇතුළත්ව උපරිම වෙළඳ පොළ වටිනාකම රු. මිලියන 43 කට පැවැති රථය අපහරණය කිරීමේ පදනම මත මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව රු. මිලියන 44 කට මිලදී ගෙන ඒ සඳහා රු. මිලියන 1 ක් ගෙවා Fix Power Folding Foot Step පද්ධතියක්ද සවිකර තිබුණි. නමුත් පැරණි වාහනය බැහැර කිරීමකින් තොරව භාවිතයට ගනිමින් පැවතුණි. | සියළු බදු ඇතුළත්ව රු. මිලියන 43 ක මුදලකට යටත්ව වාහනය මිලදී ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමැතිය ලැබී ඇති බව. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේදී නිවැරදි නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 101 - සභා ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සභාවේ නිල කාලය 2019 අප්‍රේල් 21 දින අවසන් වී තිබුණ ද එහි නිලධාරීන්ට නිලධාරියාගේ මූලික වැටුපෙන් $^{1}/_{4}$ ක් වන විශේෂ දීමනාව වහා නැවැත්වීමට කටයුතු නොකර වසර 04 කටත් වඩා වැඩි කාලයක් වන තෙක් එනම් 2023 මැයි වන තෙක් නිලධාරීන් 45 ත් - 50 ත් අතර සංඛ්‍යාවකට රු.මිලියන 15 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ගෙවීම් අනුමත කර ඇති අතර, 2023 මැයි මාසයේ සිට ගෙවීම නතර කර ඇති බව. | විධිමත් අනුමැතියක් ලබා ගෙන ගෙවීම් කළ යුතුය. |
| (ආ) | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික පරිභෝජනයට ලබා දී තිබූ රු. මිලියන 27 ක් වටිනා ජීප් රථයේ සියලු නඩත්තු කටයුතු අදාළ මන්ත්‍රීවරයා විසින් දැරිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සභා ලේකම් කාර්යාලය විසින් එහි රක්ෂණාවරණ ගාස්තු වශයෙන් රු. 729,249 ක් ගෙවා තිබුණි. | ආණ්ඩුකාර අනුමැතිය ලබා දී ඇති බව. | නීතිරීති, රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ශීර්ෂය 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව පවත්වාගෙන යනු ලබන රාජගිරිය ජනජය ගොඩනැගිල්ලේ 10 වන මහල සහ විදුලි සෝපානය වෙනුවෙන් විදුලිය, ජලය හා ගොඩනැගිලි නඩත්තු සඳහා ගිවිසුම්ගත වීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව වෙත රු. මිලියන 7.9 ක් ගෙවා තිබූ අතර රු. මිලියන 3.4 ක් ගෙවීමට තිබුණි. | ගිවිසුම් ගතවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ගොඩනැගිලි නඩත්තු කටයුතු සම්බන්ධයෙන් කඩිනමින් ගිවිසුම් ගත විය යුතුය. |

### 1.5.4 ශීර්ෂ අංක 103 - සමුපකාර සේවක කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවට අයත් ජන ජය සිටි වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 2019 ක භූමි ප්‍රමාණයක සමුපකාර සේවක කොමිෂන් | 2020 පෙබරවාරි 13 දිනැති ආණ්ඩුකාර ලිපිය පරිදි බදු කුලී ගෙවීමක් අවශ්‍ය නොවන බවත්, ජල, විදුලිය හා ගොඩනැගිලි | විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සභාව පවත්වාගෙන යනු ලබන අතර, නඩත්තු ගාස්තු සඳහා ගිවිසුමකින් තොරව නගර සභාව වෙත සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. මිලියන 2 ක මුදලක් ගෙවා තිබුණි. | පොදු පහසුකම් වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව වෙතින් නිකුත් කරනු ලබන බිල්පත් සඳහා ගෙවීම් කළ යුතු බවත් දන්වා එවා ඇත. | |
| (ආ) | සමුපකාර සේවක කොමිෂන් සභාවේ ප්‍රඥප්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව කිසිදු සේවකයෙක් ලියාපදිංචි සමුපකාර සමිතිවලට පත් කළ නොහැකි වුව ද සමුපකාර සමිති 03 ක සේවකයින් 79 ක් කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව පත් කර තිබූ නමුත් කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | සමිති විසින් අනියම් සේවකයින් බඳවාගැනීම සම්බන්ධයෙන් සමුපකාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙමින් ඉදිරියේදී නියාමනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට නියමිත බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.5 ශීර්ෂය 104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොළඹ මහ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්ට ජපානයේ විශ්ව විද්‍යාලයක අධ්‍යයන කටයුතු සඳහා 2022 ජූනි 22 දින සිට 2023 දෙසැම්බර් 24 දක්වා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. එම නිවාඩුව 2023 සැප්තැම්බර් 24 දින සිට 2024 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී තිබුණ ද, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.) විසින් වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර වැටුප් ගෙවමින් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.5.1 ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 29 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ උපදෙස්වලට පටහැනි ලෙස 2018 වර්ෂයේ සිට කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු නිලධාරීන් 16 දෙනෙකුට රු. මිලියන 12 ක් අධීක්ෂණ දීමනා ලෙස ගෙවා තිබුණි. | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තියේ 15(2) ඇ, සාමාන්‍ය බලතල යටතේ, වෙස්ප්‍රෝ කාර්යාලීය පරිශ්‍ර ආශ්‍රිත සෞඛ්‍ය ආරක්ෂක සේවය මගින් අදාළ අධීක්ෂණ දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ විධිමත් අභ්‍යන්තර පාලන විධිවිධානයක් ස්ථාපිත කර නොතිබීම සහ මුද්‍රණාලයේ අධීක්ෂණ කටයුතු ඉතාම දුර්වල මට්ටමක තිබීම හේතුවෙන් ආයතනය විසින් 2023 අගෝස්තු 08 දිනට ගණනය කර තිබූ භෞතික තොගයට අදාළව නඩත්තු කර තිබූ ගබඩා ලෙජරය, කාර්ය පත්‍රිකා සාරාංශය (Job Card), මිලදී ගැණුම් සාරාංශය (Purchase Order Summery) පදනම් කරගෙන අයිතම 38 ක මුද්‍රණ ද්‍රව්‍ය සම්බන්ධව සිදුකරන ලද විගණනයේදී රු. මිලියන 42 ක් වටිනා මුද්‍රණ තොග ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර අදාළ තොග මිලදී ගැනීමේදී ඇතැම් මුද්‍රණ ද්‍රව්‍ය ආයතනයට ලැබී නොතිබියදී ආයතනයට ලැබුණු බවට ලියකියවිලි ඉදිරිපත් කර, සහතික කර ගෙවීම් කර තිබුණි. | ගබඩා භාරකරු විසින් වංචනික අදහසින් GRN නිකුත් කර ඇති බව හා සත්‍ය වශයෙන් තොග ගබඩාවට ලද බවට සනාථ කර ගැනීමකින් තොරව GRN අනුමත කිරීම මගින් පැවති අභ්‍යන්තර පාලන ක්‍රම බිඳ දමා ඇති බව. | විධිමත් පරීක්ෂණයකින් පසුව අලාභ අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.5.2 බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සංචාරක ආකර්ෂණය ඇති කර ගැනීමේ අරමුණ සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද රු. මිලියන 14 ක ප්‍රතිපාදන මත පිළිකුත්තුව තිරසර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ අතර සංචාරක මණ්ඩලය විසින් ඇති විය හැකි ගැටළු හඳුනාගෙන ක්‍රියාත්මක නොකිරීමෙන් ව්‍යාපෘතියේ කටයුතු අතර මැද දී නැවතී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ප්‍රජාව හා වගකිවයුතු රාජ්‍ය ආයතන සමඟ වැඩමුළුවක් සංචාරක සංවර්ධන අධිකාරිය හා සංචාරක අමාත්‍යාංශයේ හා ගරු විහාරාධිපති හිමියන්ගේ මූලිකත්වයෙන් පවත්වා මූලික ක්‍රියාකාරකම් හඳුනාගන්නා ලද බව. | ගැටළු හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |
| **(ආ)** | 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය වනවිටත් වසර 07 කට වැඩි කාලයක සිට පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන් 18 දෙනෙකු සංචාරක මණ්ඩලයේ වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කර මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 5 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැති බව. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 ශීර්ෂය 105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ මිලට ගත් රු. මිලියන 35 ක් වටිනා ජීප් රථය 2021 වර්ෂයේ ආණ්ඩුකාර අනුමැතිය මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත මුදාහැර තිබුණි. 2022 සැප්තැම්බර් 21 දින අනතුරට ලක්ව තිබූ ජීප් රථයෙහි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් පුද්ගලික සමාගමක් වෙත රු. මිලියන 19 ක බිල්පතක් ගෙවීමට නියමිතව තිබූ අතර අනතුරට අදාළ රක්ෂණ වන්දි මුදල ලෙස රු. මිලියන 14 ක් රක්ෂණ සමාගමෙන් 2024 පෙබරවාරි 09 දින ගෙවා තිබුණි. මේ වන විටත් අනතුරට අදාළ වගකිවයුතු පාර්ශව හඳුනාගෙන නියෝජිත ආයතනය වෙත ගෙවීමට නියමිත ඉතිරි මුදල වූ රු. මිලියන 5 ක් ගෙවා ජීප් රථයේ අලුත්වැඩියා කටයුතු අවසන් කොට අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණි. | වගකිවයුතු පාර්ශව හඳුනාගැනීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අනතුර සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ පියවාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය 106 - කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හෝමාගම දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික උද්‍යානයක් ස්ථාපිත කිරීම - අදියර III ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1.2 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1.2 ක් වූ පුනරාවර්තන වියදම් මෙම ව්‍යාපෘතිය මඟින් දරා තිබුණි. | උද්‍යානයේ නඩත්තු කටයුතු වෙනුවෙන් දෛනික පදනමින් සේවකයින් යොදවා එම වියදම් ව්‍යාපෘතිය යටතේ සිදු කළ බව. | පුනරාවර්තන වියදම් දැරීම සඳහා ව්‍යාපෘති ප්‍රතිපාදන වෙන් නොකළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 107 - මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධසේවා සමූපකාර සමිති විසින් සිය ලාභ පුළුල් කර ගැනීමේ අරමුණින් පවත්වාගෙන | සමූපකාර සමිතිවල දායකත්වය ලබා දීම සමූපකාර | සමූපකාර සමිති සාමාජිකයන් |

| | | | |
|---|---|---|---|
| | යන ප්‍රාදේශීය අලෙවිසැල් හා කෝප් සිටි රාජ්‍ය වත්කම් ලෙස නොසලකන නමුත් ඒවායේ සිදු කෙරමින් තිබූ නවීකරණ ව්‍යාපාර කටයුතු සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් රු. මිලියන 17 ක ප්‍රතිපාදන වෙන්කර මුදල් නිදහස් කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්ය වන අතර නවීකරණය කටයුතු සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති ප්‍රතිපාදන අමාත්‍යාංශය විසින් නිදහස් කර ඇති බව. | විසින් ලාභ පුළුල් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කටයුතු සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකළ යුතුය. |

**1.5.8.1 බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන සහතිකවල නිරවද්‍යතාව සනාථ කරගන්නා ලද නිලධාරීන් 361 අතරින් නිලධාරීන් 49 දෙනෙකු ව්‍යාජ සහතික ඉදිරිපත් කරමින් අධිකාරියේ විවිධ තනතුරුවලට පත්වීම් ලබා ගෙන තිබුණි. අධිකාරියේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව වේලාසටහන්කරුවන් බඳවාගැනීමේ අවම සුදුසුකම් වශයෙන් ගණිතය සමත්වීම දක්වා තිබුණද ව්‍යාජ සහතික ඉදිරිපත් කර අධිකාරියේ සේවයට බැඳුණු නිලධාරීන්ගෙන් සියයට 90 කට වඩා වැඩි පිරිසක් වේලාසටහන්කරුවන් විය. | එකඟවන බව හා මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 52 ක් වේලාසටහන්කරුවන් වන අතර එම තනතුරුවලට අදාළව ව්‍යාජ සහතික අනාවරණය වී ඇති බව. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවම සුදුසුකම් තිබිය යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේදී රු. මිලියන 2 ක පිරිවැයක් දරා ගුණසිංහපුර බස් නැවතුම්පළෙහි සවිකරන ලද සූර්ය විදුලි පහන් 15 ක් සහිත සූර්ය බලශක්ති පද්ධතිය 2016 සිට අක්‍රියව පැවතුණ අතර, විදුලි පහන් කණු 09 ක් ගලවා බස් නැවතුම්පළෙහි වසර 07 කට අධික කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි. මෙම සූර්ය බලශක්ති පද්ධතිය නැවත යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණ අතර ඒ වෙනුවෙන් දැරූ රු. මිලියන 2 ක වියදම නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. | බැටරි සහ සෙසු උපකරණ සම්පූර්ණයෙන් අක්‍රිය වී ඇති බැවින් නැවත යාවත්කාලීන කළ නොහැකි බව. | ඌන උපයෝජිත සම්පත් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) | 1992 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තිය යටතේ 2007 මාර්තු 16 දිනැති අංක 1488/32 දරන ගැසට් පත්‍රයේ සඳහන් 3.1 නියෝගය ප්‍රකාරව, පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ධාවකයා තෝරා ගැනීමේදී බස්නාහිර පළාත තුළ මගී ප්‍රවාහනය සඳහා බස් රථ යෙදවීම පිණිස මගී සේවා අවසර | 2007 වර්ෂයේ ටෙන්ඩර් ක්‍රමවේදය හඳුන්වාදීමට ප්‍රථම නිකුත් කර තිබූ බලපත්‍ර බව. | විධිමත් ටෙන්ඩර් පටිපාටියක් භාවිතා කළ යුතුය. |

පත්‍ර නිකුත් කිරීම කරනු ලබන්නේ ටෙන්ඩර් ක්‍රමය මගින් තෝරා ගනු ලබන බස් හිමි ධාවකයින් වෙත පමණක් ලෙස දක්වා තිබුණද, ඊට පටහැනිව අධිකාරිය විසින් 2023 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය සේවා, සුඛෝපභෝගී සේවා, අධිවේගී සේවා යටතේ මාර්ග 505 ක් සඳහා මඟී සේවා බලපත්‍ර 6047 ක් නිකුත් කර තිබුණු අතර, ඉන් බලපත්‍ර 5454 ක් හෙවත් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවෙන් සියයට 90 ක් විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව ලබාදී තිබුණි.

### 1.5.8.2 මාර්ග සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 23 ක් වූ මිනුවන්ගොඩ බස් නැවතුම් පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 4 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය නිම කළ යුතු දිනය වූ 2022 මාර්තු 05 දින කොන්ත්‍රාත්තුව නිම කර නොතිබූ බැවින් සියයට 10 ක් වන රු. මිලියන 2 ක වැඩ කොටසක් ඉටු කර තිබියදී ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය කර තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ අත්තිකාරම් මුදල් ඉතිරිය වන රු. මිලියන 2 ක මුදල කොන්ත්‍රාත්කරු විසින් මාස 14 ක කාලයක් අත රඳවාගෙන තිබුණි. කෙසේ වුවද, බස් නැවතුම් පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ නව සංශෝධිත ඇස්තමේන්තුව රු. මිලියන 50 ක් වී තිබුණි. පළමු කොන්ත්‍රාත් ඇස්තමේන්තු මුදල හා නිම කළ වැඩවල වටිනාකමේ එකතුව රු. මිලියන 52 ක් වූ බැවින් රු. මිලියන 29 ක විචලනයක් මුළු ව්‍යාපෘතිය තුළ සිදු වී තිබුණි. | විදුලි රැහැන් කණු ඉවත් කිරීමට අනපේක්ෂිත කාලයක් ගතවීම, UDA සැලසුමට අනුව Septick tank, Sokage pit ලබා දීමට නගර සභාව එකඟ නොවීම, ඉන්ධන හිඟය, සිමෙන්ති හිඟය යන හේතු නිසා ප්‍රමාද වූ බව. | ව්‍යාපෘති ඉටු කිරීම ප්‍රමාද නොකළ යුතුය. |
| (ආ) | 2012 වර්ෂයේදී පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු. මිලියන 156 ක ඇස්තමේන්තු වටිනාකමකට මිනුවන්ගොඩ රෙජී රණතුංග කණිෂ්ඨ විද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදිකිරීම සඳහා බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට | ප්‍රතිපාදන නියමිත පරිදි නොලැබීම නිසා ප්‍රමාද වූ බව හා ඉදිරි මාස 04 ක් ඇතුළත වැඩ අවසන් කර භාවිතය සඳහා භාර දීමට නියමිත බව. | නියමිත කාලය තුළ ව්‍යාපෘති අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවරා තිබුණි. පිහිනුම් තටාකය, වාහන නැවතුම් අංගනය, ඇඳුම් මාරු කිරීමේ කාමර, වැසිකිලි, ව්‍යාපාරික ස්ථාන සමඟ මහල් 03 කින් යුතුව ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 187 ක් වැය කර තිබුණි. පිහිනුම් තටාක ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි වසරක් තුළ නිම කිරීමට අපොහොසත් වී තිබුණු අතර ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භකර වසර 12 ක් ගත වුවද ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට නොහැකි වී තිබුණි. එසේම අපේක්ෂිත කාලය තුළ ව්‍යාපෘති කටයුතු නිමකිරීමට නොහැකිවීම මත රු.මිලියන 156 කට ඇස්තමේන්තු සකස්කර තිබූ ව්‍යාපෘතිය සඳහා නැවත රු. මිලියන 277 කට ඇස්තමේන්තු සකස් කර තිබූ අතර, නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පළාත් සභාවට රු. මිලියන 31 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | | |
| (ඇ) | දිවුලපිටිය කොන්ක්‍රීට් පෙර නිමි අංගනය තුළ වසර ගණනාවක සිට අවිධිමත් පරිදි දමා තිබූ බාජ් 02 ක කොටස් 15 ක්, වාහන 04 ක් හා යන්ත්‍ර 02 ක් විධිමත් පරිදි ලේඛනගත කිරීමකින් තොරව දිරාපත් වෙමින් අංගනයේ ගාල් කර පැවතුණ අතර Premix Plant යන්ත්‍රය 2020 වර්ෂයේ සිට මාර්ග සංවර්ධන කටයුතු සඳහා යොදා නොගැනීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. | පිළිගන්නා බව හා 2024 වර්ෂයේ මෙම යන්ත්‍ර මගින් ව්‍යාපෘති කීපයක් ඉටු කිරීමට යෝජිත බව. | නිශ්කාර්ය සම්පත් උපයෝජනයට කටයුතු කළ යුතුය. |

**1.5.8.3 කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජය විසින් නව ව්‍යාපාර ආරම්භ කිරීම, ප්‍රාග්ධන වියදම් දැරීම මුළුමනින්ම අත්හිටුවන ලෙස දන්වා තිබියදී ඒ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව හා විධිමත් ශක්‍යතා අධ්‍යයනකින්/ ව්‍යාපෘති සැලසුමකින් තොරව මිනුවන්ගොඩ වල්පිට ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතියක් 2020 වර්ෂයේදී ආරම්භ කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පියවර ගෙන තිබුණි. ටින් මාළු සැකසීම සඳහා කර්මාන්ත | චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර ආරම්භ කර තිබුණි. මේ වන විට ඇසුරුම්කරණ ගබඩාව භාවිතා වන බව හා Test Run කිහිපයක් සිදු කර තිබුණු නිසා යන්ත්‍රසූත්‍ර නිෂ්ක්‍රීයව නොපැවතුණ අතර සමහර යන්ත්‍රසූත්‍ර සඳහා 2023 සැප්තැම්බර් දක්වා වගකීම් කාලයක් පැවතුණු බව. | ව්‍යාපෘති නියමිත පරිදි සැලසුම් කළ යුතු අතර අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

ශාලාවක් හෝ ඉදි කර නොමැති විටක ටින් මාළු සැකසීමේ යන්ත්‍රාගාරය මිලදී ගෙන තිබූ අතර, අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 94 ක් වැය කර තිබුණි. ඉන්පසු වසර කිහිපයකට පසුව කර්මාන්ත ශාලාව ඉදි කිරීම සිදු කර 2023 වර්ෂයේදී නිෂ්පාදනය ආරම්භ කරන අවස්ථාව වන විට මිල දී ගත් යන්ත්‍රවල වගකීම් කාලය ද ඉක්මවා තිබුණි. තවදුරටත් නව කර්මාන්ත ශාලාවට සේවකයින් බඳවා ගැනීම් සහ යන්ත්‍රාගාරයේ ඇසුරුම් ගබඩාව හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධතිය සහ නව ඉදිකිරීම් කිරීම සඳහා රු. මිලියන 213 ක් ඇතුළු වැය වූ මුළු මුදල රු. මිලියන 307 කි.

**1.5.8.4 සමුපකාර අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018-2023 දක්වා කාලය තුළ සමුපකාර අරමුදලින් සමුපකාර සමිති වෙත ලබා දී තිබූ ණය මුදලින් ණය ගෙවීම පැහැර හැර තිබූ සමුපකාර සමිති 23 කින් 2023 දෙසැම්බර් 31 දිනට සමුපකාර අරමුදලට වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය රු. මිලියන 92 ක් විය. ඉන් සමුපකාර සමිති 9 කින් රු. මිලියන 40 ක මුදලක් වසර 03 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආපසු අයකර ගැනීම පිළිබඳ විධිමත් වැඩපිළිවෙළක් නොමැතිව සමුපකාර සමිති වෙත රු.මිලියන 25 ක ණය මුදලක් ලබා දී තිබුණි. එසේම සමුපකාර අරමුදලේ දායක මුදල් හිඟ හිට ඇති අවස්ථාවන් හි දී ද සමුපකාර සමිති සඳහා ණය ලබා දී තිබුණි. එමෙන්ම 2002-2023 දක්වා කාල පරිච්ඡේදය තුළ කිසිදු ඇප සුරක්ෂණයක් ලබා ගැනීමෙන් තොරව සමුපකාර සමිති 155 ක් සඳහා රු. මිලියන 1,220 ක ණය ලබා දී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට සමස්ත ලැබිය යුතු ණය ශේෂය රු. මිලියන 701 ක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සමුපකාර සමිතිවලට ණය ලබාදීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සකස් කළ යුතුය. |

### 1.5.8.5 බස්නාහිර පළාත් නිවාස සංවර්ධන අරමුදල

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1990 අංක 03 දරන බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව නිවාස සංවර්ධන අරමුදලෙන් අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ආධාර පමණක් ලබාදීමට කටයුතු කර තිබූ අතර නිවාස ණය ලබාදීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | පිළිගන්නා බව හා මේ සම්බන්ධයෙන් රීති පැනවීමක් මේ වන තෙක් සිදුකර නොමැති බව. | ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.9 ශීර්ෂය 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් 2016 අප්‍රේල් 16 දින දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව පිවිසුමේදී හදිසි ගිනිගැනීමකට ලක් වී තිබූ අතර එහි සම්පූර්ණ අලාභය වන රු. මිලියන 2.7 න් මෝටර් රථය පදවාගෙන ගිය සහකාර ලේකම්ගෙන් අයවිය යුතු රු. මිලියන 2.6 ක මුදල අය කර ගෙන නොතිබුණි. | මෙම වටිනාකම අයකර දෙන ලෙස ඉල්ලා විගණකාධිපති වෙතද පිටපත් සහිතව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති බව. | අලාභය අදාළ පාර්ශවයන්ගෙන් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ගම්පහ සිරිමාවෝ බණ්ඩාරණායක ක්‍රීඩා සංකීර්ණය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිතිව පැවති අතර එම ඉඩම අමාත්‍යාංශයට පවරා ගෙන නොතිබුණි. | වසර ගණනාවක සිට පවරාගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ඉඩම අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතු බප/මීග/දවිසමර විද්‍යාලයට අයත් ඉඩමේ නිරවුල් භුක්තිය 1979 ජූලි 07 දින අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර එම ඉඩමේ පර්චස් 50 ක ප්‍රමාණයක් නිශ්චිත දින වකවානුවක් නොමැතිව අතීත කාලයක සිට අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී ඇති බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශය විසින් මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මතුගම ශාන්ත මරියා මහා විද්‍යාලයේ පාසලේ පිහිටි අඩි 70 X 25 දෙමහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මිලියන 13 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. ප්‍රතිපාදන නොලැබීම මත රු.මිලියන 8 ක මුදලක් වැයකර ගොඩනැගිල්ලේ කොටසක් පමණක් ප්‍රතිසංස්කරණය කර ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි. මෙම පරිශ්‍රය පාසල් සිසුන් සඳහා අනාරක්ෂිතව පවතින බවත්, 06 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා ශ්‍රේණි 05 ක් සඳහා සිසුන්ට සතියකට එක් දිනක් ඉගැන්වීම් කටයුතු සිදු නොකර නිවාඩු ලබාදීමට සිදු වී තිබුණි. විද්‍යාගාරය හා ගෘහ විද්‍යා කාමරයද පංති පැවැත්වීමට යොදාගෙන තිබුණ බැවින්, සිසුන්ට ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වී තිබුණි. | පිළිගන්නා බව. | අධ්‍යාපනයට බාධාවක් නොවන පරිදි ව්‍යාපෘති අවසන් කර ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඉ) | බස්නාහිර පළාත් සභාවේ කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්ක තුනෙහි පාසල්වල අඩුපාඩු හා පහසුකම් නැංවීමට ප්‍රමාණවත් අරමුදල් නොමැතිව තිබියදී අධ්‍යාපන අමාත්‍යාංශය හරහා 2023 වර්ෂයේ කඩවත, මහර වෙසක් කලාපය සඳහා ඉදි කළ තාවකාලික කුටි, ශබ්ද විකාශන යන්ත්‍ර හා සැරසිලි කටයුතු වෙනුවෙන් රු. මිලියන 10 ක මුදලක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා වැය කර තිබුණි. | බස්නාහිර පළාත් වෙසක් උත්සවය ලෙස සංවිධානය වූ අතර මහර ප්‍රාදේශීය ලේකම්, මහර ප්‍රාදේශීය සභාව මෙන්ම ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය ද සහයෝගය හා සම්බන්ධීකරණය ලබා දී ඇති බව හා ජනාධිපති ලේකම් විසින් වෙසක් කලාපය සඳහා සහාය ලබා දෙන ලෙස ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | අත්‍යවශ්‍ය කටයුතු සඳහා රාජ්‍ය මුදල් භාවිතා කළ යුතුය. |

**1.5.10 ශීර්ෂය 109 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 මාර්තු 07 හා අංක NSCC/10/79/GE/AL දරන ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලිපිය, 2019 මාර්තු 29 දිනැති හා අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය හා 2018 ජූලි 18 දිනැති අංක 03/2018 කළමනාකරණ සේවා චක්‍රලේඛ වලට පටහැනිව අයවැය අංශයේ නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී වන අයවැය පිළියෙල කිරීම හා ඒ සම්බන්ධ කටයුතු කිරීම සඳහා ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය), අධ්‍යක්ෂ (අයවැය) ඇතුළු අයවැය අංශයේ නිලධාරීන් | සංකීර්ණ කාර්යයන් සමූහයක් මෙහෙයවන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 06 දෙනෙකුට චක්‍රලේඛවලට පටහැනි ලෙස 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඔවුන්ගේ වැටුපට අමතරව වැටුපෙන් 1/3 ක් ලෙස රු. මිලියන 3.6 ක දීමනාවක් මාස 05 ක කාලයක් සඳහා ගෙවා තිබුණි. | | |
| (ආ) | 2022 මාර්තු 07 හා අංක NSCC/10/79/GE/AL දරන ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලිපිය, 2019 මාර්තු 29 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය හා 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛවලට පටහැනි ලෙස පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 13 දෙනෙකු යොදවා මානව සම්පත් සංවර්ධන හා පුහුණු ආයතනයක් ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා වැටුපට අමතරව එම නිලධාරීන්ට සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී රු. 404,000 ක පුහුණු දීමනාවක් ද ගෙවා තිබුණි. | වැඩ සටහන් පවත්වන දිනයන්හිදී ඊට සහභාගී වන නිලධාරීන්ට පමණක් ගෙවීම් කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර නිල වාහන හිමිකම ඇති තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක සේවය කරන විට නිත්‍ය තනතුරට හිමි ඉන්ධන දීමනාව පමණක් ලබා දිය යුතු වුවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත 2023 වර්ෂයේ දෙසැම්බර් මාසය හා 2024 වර්ෂයේ ජනවාරි මාසය සඳහා රු.125,504 ක අතිරේක ඉන්ධන සඳහා දීමනාවක් ගෙවා තිබුණි. | ඉන්ධන දීමනාවක් ගෙවා ඇති බව පිළිගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් මූල්‍ය රීති 416.1 හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ හා අනුබද්ධ ආයතනවලට සනීපාරක්ෂක සේවාව හා ආරක්ෂක සේවාව අදාළ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගවලින් තොරව ලබාගෙන 2023 වර්ෂය සඳහා රු. මිලියන 101 ක් ගෙවීම් කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 ප්‍රකාර ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතු වුවත් මාර්ග අමාත්‍යාංශයෙන් 2020 ජූනි 26 දින අඹතලේ ටිකිරි කුමාර විද්‍යාලය සඳහා ලැබී තිබූ රු. මිලියන 26.1 ක් 2023 දෙසැම්බර් 31 දක්වා එනම් වර්ෂ 3 ½ ක කාලයක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මුදල රඳවා ගන්නා ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ඉල්ලා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පානීය ජල බෝතල් සපයන ආයතනයකින් විගණනය විසින් ලබාගත් තොරතුරු අනුව මාසිකව ලීටර් 19 පානීය ජල බෝතල් 100 කට වඩා මිලදී ගන්නා විට රු. 220 ක මුදලකට (ප්‍රවාහනය සමඟ) සපයාගත හැකිව තිබියදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව පානීය ජල බෝතලයක් රු. 384 බැගින්, වෙස්ප්‍රෝ ආයතනයෙන් සපයා ගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් එක් ජල බෝතලයක් සඳහා රු. 164 බැගින් 2023 වර්ෂය සඳහා වැඩිපුර රු. මිලියන 2 ක මුදලක් අතර මැදි ආයතනයකට ගෙවා තිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | බස්නාහිර පළාත් සභාවේ ආයතන 10 කට අදාළව තනතුරු 14 කට අයත් නිලධාරීන් 39 දෙනෙකුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් සීමාවන් ඉක්මවා පළාත් ආණ්ඩුකාර අනුමැතිය මත මාසික ඉන්ධන සීමාව වැඩි කර ගෙන 2012 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු. මිලියන 16 ක වැඩිපුර ඉන්ධන දීමනා ගෙවා තිබුණි. තවද, අදාළ චක්‍රලේඛයේ නිලධාරීන් විසින් මාසිකව අතිරේක රාජකාරී ගමන්වල යෙදෙන්නේ නම් පමණක් ගමන් කළ දුර ප්‍රමාණය අනුව අතිරේක ඉන්ධන ලබා ගැනීමට හැකියාවක් තිබුණද, එකී චක්‍රලේඛ ප්‍රතිපාදන කිසිදු ආකාරයකින් සැලකිල්ලට නොගෙන අතිරේකව ගමන් කළ දුර ප්‍රමාණයන් නොසලකා චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කර තිබුණි. | ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය හා ආණ්ඩුකාර අනුමැතිය ලැබී ඇති බව. | චක්‍රලේඛයට අනුගතව ඉන්ධන දීමනා ගෙවිය යුතුය. |
| (ඌ) | එකතුව රු. මිලියන 5 ක් වූ වත්කම් 17 ක ප්‍රමාණයක් අවුරුදු 03 ක සිට අවුරුදු 05 ක් දක්වා පරාසයක කාලයක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි. | පිළිගන්නා බව. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ප්‍රධාන ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන 13 ක පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | ඉදිරියේදී කටයුතු කරන බව. | භෞතික පැවැත්ම තහවුරු කර ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන අනුව රජයේ නිලධාරීන්ට රජයේ නිවසක් ලබා දීම කළ හැකි වුව ද මාසිකව නිවාස දීමනාවක් ගෙවීමට කිසිඳු හැකියාවක් නොමැත. එසේ වුව ද ඒ පිළිබඳ අවධානය යොමු නොකර නිල නිවාස ඉදි කරන තෙක් තාවකාලික ගෙවීමක් ලෙස දක්වමින් බස්නාහිර පළාත් සභාවේ ඉහළම තනතුරු දරන නිලධාරීන් 14 දෙනෙකුට 2017 නොවැම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. මිලියන 25 ක නිල නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණි. | ආණ්ඩුකාර අනුමැතිය මත ගෙවා ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාර කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂ අංක 110 - ඉංජිනේරු කාර්යංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/ 2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර වියදම් සීමා කිරීම් කර තිබියදීත් රු. මිලියන 14 ක් වටිනා ඩ්‍රෝන යානා 02 ක් මිලදී ගෙන තිබුණු අතර කාර්යංශය විසින් ඒවා උපයොජනය කර නොතිබුණි. | එම ඩ්‍රෝන යානා 02 සෞඛ්‍ය අමාත්‍යාංශයට භාරදී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණය යටතේ පාසල්වල ක්‍රියාත්මක කර තිබූ එකතුව රු. මිලියන 120 ක් වටිනා ව්‍යාපෘති 59 න් ව්‍යාපෘති 50 ක් හෙවත් සියයට 85 ක් පමණ ක්‍රියාත්මක කිරීමේදී තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව පාසල් සංවර්ධන සමිති හා වෙනත් ප්‍රජා පාදක සංවිධාන වෙත පිරිනමා තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ප්‍රසම්පාදන ක්‍රමවේදය දැනුම් දෙනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 111 - ආදායම් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සභාවේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නීතිඥවරුන් ලියා සහතික කරනු ලබන ඔප්පුවල දෙවන පිටපත් සඳහා හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගත යුතු නමුත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 16 කින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂවලට අදාළ වටිනාකම රු. මිලියන 7,303 ක් වූ ඔප්පු 4896 ක තොරතුරු 2023 වර්ෂයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණ ද, ඉන් ඔප්පු 4,693 ක් සම්බන්ධයෙන් ලිපිගොනු විවෘත කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට ලැබී ඇති ඔප්පු සියල්ලම 2024 මැයි 30 දිනට කටයුතු නිම කර අවසන් කිරීමට සියළුම කාර්යාල දැනුවත් කර ඇති බව. | තොරතුරු ගෙන්වා ගැනීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ වටිනාකම රු. මිලියන 2,716 ක ඔප්පු 1171 ක් හුවමාරු කර තිබුණ ද අවිස්සාවේල්ල, කළුතර, ගම්පහ, අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් සාධන පත්‍ර 99 කට පමණක් මුද්දර ගාස්තු අයකර ගෙන තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට ලැබී ඇති ඔප්පු සියල්ලම 2024 මැයි 30 දිනට කටයුතු නිම කර අවසන් කිරීමට සියළුම කාර්යාල දැනුවත් කර ඇති බව. | - එම - |
| (ඇ) | බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමිකම් පැවරීම වෙනුවෙන් මුද්දර ගාස්තු අයකිරීමේදී ස්ථාපිත කර තිබෙන පාලන ක්‍රමවල දුර්වලතා හේතුවෙන් 2017 නොවැම්බර් 30 දින අංක 738 දරන ඔප්පුව පැවරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 4 ක මුද්දර ගාස්තුව අදාළ නොතාරිස්වරයා විසින් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් නොකොට පෞද්ගලික පරිහරණයට ගෙන තිබුණි. මෙම මුදල හා ඒ සම්බන්ධයෙන් වූ දඩ මුදල සමඟ රු. මිලියන 8 ක් අයකර ගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 47142/5 දරන නඩුව ගොනුකර තිබුණි. මේ කාලවකවානුව අතරතුර අදාළ නොතාරිස්වරයා මිය යෑම හේතුවෙන් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. මිලියන 4 ක මුද්දර ගාස්තු අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව. | ආදායම් අය කර ගත යුතුය. |

**1.5.13 ශීර්ෂය 112 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි 01 දිනට පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ රු. මිලියන 6 ක වෙනසක් පැවතුන අතර, 2002 දෙසැම්බර් 31 දින ප්‍රධාන අමාත්‍යාංශයට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම මගින් කළ ගෙවීමක් නිසා මෙම වෙනස ඇතිවී තිබුණු බව කමිටුවක් මගින් දන්වා තිබූ නමුත්, මෙම ගෙවීම පිළිබඳ විස්තර හා අදාළ අනුමැතීන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 1990 වර්ෂයේ සිට පැවත එන වෙනසක් වූ අතර මේ සඳහා පත් කළ කමිටුව විසින් රු.මිලියන 5 ක මුදලක් ‘ජ’නල්’ සටහන් මගින් නිරවුල් කර තිබුණු බව හා මීට වසර 21 කට පෙර සිදු වී ඇති ගණුදෙනුවක් බැවින් වෙනත් ලේඛන සොයාගත නොහැකි බව. | අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නිරවුල් නොකළ අග්‍රිම ශේෂවල එකතුව රු. මිලියන 107 ක් විය. | සෞඛ්‍ය අමාත්‍යාංශය හා වෛද්‍ය සැපයීම් අංශය වෙතින් ප්‍රතිපූර්ණය නොකළ සීමාවාසික/පශ්චාත් සීමාවාසික වෛද්‍ය වැටුප් හා අක්ෂි කාච මිලට ගැනීම්වලට අදාළ ශේෂයන් වන බව හා ඒවා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අග්‍රිම ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහන සංචිතයේ 2017 – 2022 වර්ෂවල සිට භාවිතා නොකළ ඉන්ධන ලබා නොගත් වාහන 42 ක් පැවතුණි. එම වාහන අතුරින් වාහන 21 ක් 2019 වර්ෂයේ සිට දීර්ඝ කාලීනව ගරාජ්වල සහ කාර්යාල පරිශ්‍රයේ වැස්සට හා අව්වට නිරාවරණය වෙමින් දිරාපත් වෙමින් පැවතුණි. | අලුත්වැඩියා කටයුතු සඳහා යොමුකර ඇති බව හා අපහරණ කටයුතු සඳහා යොමු කර ඇති බව. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන හා යතුරු පැදි 87 ක පැවැත්ම තහවුරු කරගත නොහැකි විය. | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | වාහනවල පැවැත්ම තහවුරු කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය ආයතන 7 ක 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2 ක් වටිනා කල් ඉකුත්වූ ඖෂධ හා රු. මිලියන 19 ක් වටිනා තත්ත්වයෙන් අසමත් ඖෂධ තිබූ අතර එකී කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් අසමත් ඖෂධවලින් රජයට සිදුවී ඇති පාඩුව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් තුළින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන එකී ඖෂධ කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි | 2020 – 2022 වර්ෂ අතරතුර කාලය Covid වසංගතය හේතුවෙන් රෝගීන් පැමිණීම සීමිත වූ අතර, වෙනත් රෝහල්වල ද අතිරික්ත පැවතුණ හෙයින් මාරු කර යැවීමක් ද සිදු නොවිය නමුත් අපහරණය කිරීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත දැනුම් දී ඇති බව. | ඖෂධ කල් ඉකුත් වීමට ප්‍රථම භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂ අංක 114 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලුනාව ආයුර්වේද රෝහලේ 2023 පළමු අර්ධ වර්ෂය තුළ නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තුගත කරන ලද ඖෂධ වර්ග 21 ට අදාලව කිසිදු නිෂ්පාදනයක් සිදු කර නොතිබුණු අතර ඖෂධ වර්ග 07 ක් 2023 පළමු අර්ධ වර්ෂයේ ඇස්තමේන්තුගත ඖෂධ නිෂ්පාදන ධාරිතාවය වෙත ළඟා වී නොතිබුණි. | ජුලි මාසයේ සිට නිෂ්පාදනය කර ඇති බව. | සැලසුම් කළ ආකාරයට නිෂ්පාදන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වෛද්‍ය නිල නිවසක් නැබොඩ ආයුර්වේදීය සංචාරක බංගලාවක් ලෙස නවීකරණය සඳහා 2019 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. මිලියන 17 ක මුදලක් වැය කර තිබුණද එම සංචාරක බංගලාව ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය හා අනුමැතිය මත ලබාගත් තීරණ ක්‍රියාත්මක කරමින් පවතින බව. | ගොඩනැගිල්ල හා ලීබඩු උපකරණ කඩිනමින් භාවිතයට ගත යුතුය. |

**1.5.16 ශීර්ෂය 115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගංගොඩවිල මෙත් සෙවන නිවර්තන නිවාසය කොලොන්නාව සන්ෆලවර් විලේජ් පරිශ්‍රයේ ස්ථානගත කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද එය මේ දක්වා ඉටු නොකිරීම හේතුවෙන් නිවර්තන නිවාසයේ රැඳවියන් වර්තමානයේ රැඳී සිටින පරිශ්‍රයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් ද ප්‍රමාද කිරීම | නේවාසිකාගාරවල අලුත්වැඩියාවන් සිදු කර ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිසා එකී ගොඩනැගිලි රැඳවියන්ට ජීවත් වීමට නුසුදුසු පරිසරයක් වී තිබුණි. | | |
| (ආ) | 1907 අංක 05 දරන නිවර්තන නිවාස ආඥාපනතට පටහැනිව ගංගොඩවිල මෙත් සෙවන නිවර්තන නිවාසයේ රැඳවියන් සමාජගත කිරීම ඉතාම අවම මට්ටමක පැවති අතර ආයතනයේ සිටින මුළු රැඳවියන් 138 න් රැඳවියන් 6 දෙනෙකු වර්ෂ 30 කට වැඩි කාලයක් ආයතනයේ රැඳී සිටින අතර වර්ෂ 20-30 කාලයක් රැඳවියන් 18 දෙනෙකු රැඳී සිටින බවත් වසර 10 - 20 කාලයක් රැඳවියන් 56 ක් රැඳී සිටින බවත් වර්ෂ 10 ට වඩා අඩුවෙන් රැඳවියන් 58 ක් රැඳී සිටින බවත් නිරීක්ෂණය විය. | නේවාසිකාවන් 120 ක් පමණ මානසික රෝග සඳහා ප්‍රතිකාර ලබන්නන් වන අතර ඔවුන් බොහෝමයක් සාමාන්‍ය පරිදි සමාජගත කිරීමට නොහැකි බව. | නිවර්තන නිවාස ආඥා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | බෙල්ලන්තර මිත්සෙවන විශේෂිත ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටා ඇති, පරිත්‍යාගයකින් ලද රූඩ් 03 පර්.31 ක ඉඩම පිළිබඳව අයිතිය තහවුරු කිරීමට අදාළව ලබාගත යුතු හිමිකම් සහතික ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තියක් වන උරුමය වැඩසටහන ක්‍රියාත්මක බැවින් එම කටයුතු අවසන් වූ පසු පවරා දීමට අදාළ කටයුතු ඉඩම් අමාත්‍යාංශය මඟින් සිදු කරන බව වාචිකව දන්වා ඇත. | හිමිකම් සහතික ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.17 ශීර්ෂ අංක 116 - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රම්මුතුගල සහතික කළ බාලිකා පාසලට අනුමත කාර්ය මණ්ඩලය සඳහා මේ දක්වා කිසිදු ගුරුවරයෙකු සේවයේ යෙදී නොතිබුණි. තවද, සහතික කළ පාසල තුළ සිටින දරුවන් අතරින් පාසල් යන ළමුන් සංඛ්‍යාව 2021, 2022 හා 2023 වර්ෂයන්හිදි පිළිවෙලින් 17, 12 හා 07 ක් වශයෙන් අඩුවී තිබුණි. | බඳවා ගැනීම් සඳහා ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව ආරම්භ කරන අවස්ථාවේදී මධ්‍යම රජයෙන් ලබා දී තිබුණු පරිගණක ඒකකය, තිස්ස නේවාසිකාගාරය සහ සුළු සේවක නිවාසය වසර ගණනාවක් නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී මෙම අංශය භාවිතයට ගැනීමට හැකියාව පවතින බව. | හැකි ඉක්මණින් මෙම ගොඩනැගිලි අදාල කාර්යයන් සඳහා යොදා ගත යුතුය. |

**1.5.18 ශීර්ෂ අංක 120 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | කොටදෙනියාව සත්ත්ව පාලන මධ්‍යස්ථානය සහ තෘණ සම්පත් මධ්‍යස්ථානය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් හෙක්ටයාර් 16 ක ඉඩමක් දෙපාර්තමේන්තුව 2003 ජනවාරි 28 දින පවරාගෙන තිබුණි. ඒ වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල වූ රු. මිලියන 26 න් තවදුරටත් ගෙවිය යුතු රු. මිලියන 24 ක් ගෙවීම වර්ෂ 18 ක් ප්‍රමාද වීම නිසා රු. මිලියන 32 ක පොළී මුදලක් දෙපාර්තමේන්තුව විසින් නිශ්කාර්යව ගෙවා තිබුණි. | වන්දි මුදල් ගෙවීමට අදාළව ප්‍රමාදය කුමන නිලධාරියෙකුගේ අඩු පාඩුවක් නිසා සිදුවූවක්ද යන්න සොයා ගත නොහැකි බව | රජයේ මුදල් අරපිරිමැස්මෙන් සහ කාර්යක්ෂමව වැය කළ යුතුය. |

**1.5.19 ශීර්ෂ අංක 121 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් රැස්කර බෙදාහැරීම සම්බන්ධයෙන් සියලු පළාත් ප්‍රධාන ලේකම්වරුන් එකඟතාවයකට පැමිණ නීතිමය විධිවිධාන සැකසෙනතුරු eRL-2-0 පද්ධතිය අවහිර කිරීම (block) සඳහා කටයුතු කිරීමට තීරණය කිරීම නිසා eRL-2-0 ව්‍යාපෘතිය සඳහා දරන ලද රු. මිලියන 24 හා අනෙකුත් පළාත් වලින් දරන ලද රු.මිලියන 30.91 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත් වී තිබුණි. 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය 2024 මාර්තු 21 දින දක්වාම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අනෙකුත් පළාත්වල ක්‍රියාත්මක කිරීමෙන් පසු බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කරන බව. | ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආදයම් බලපත්‍ර 60,000 කට අධික ප්‍රමාණයක් ඇතැම් දිනවල දිවයින තුළ නිකුත් කර තිබුණ ද නව eRL-2-0 පද්ධතියෙන් දිනකට නිකුත් කළ හැකි බලපත්‍ර සංඛ්‍යාව 36,000 ක් පමණි. සැලසුම් සකස් කිරීමේදී පද්ධතියේ ධාරිතාවය පිළිබඳ (System Capacity) නිසි අධ්‍යනයක් සිදු කර නොතිබීම නිසා පද්ධතිය අඩාල වීමට ද ඉඩ තිබුණි. | දැනට භාවිතා වන eRL1.0 පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවන බැවින් නව පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් පරිදි වැඩි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත දැනුම් දී ඇති බව. | ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු අතර, ප්‍රමාණවත් ධාරිතාවයකින් යුක්තව පද්ධතිය පවත්වා ගත යුතුය. |

**1.5.20 ශීර්ෂ අංක 122 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 51 ප්‍රකාර නියමිත කාලය තුළ දෙපාර්තමේන්තුවේ වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා සිදු වී තිබූ අනතුරු අලුත්වැඩියාව සඳහා වැය වී තිබූ රු. මිලියන 2 ක හානිය පූර්ණය කර ගැනීමට හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව සියළු සංචිත වාහන රක්ෂණය කළ බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 10.8 වන වගන්තියට පටහැනිව 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 49 කදී විදේශගත වී ඇති නිලධරයකු සම්බන්ධයෙන් පැවැත්වූ මූලික විමර්ශන වාර්තාව අනුව, අවස්ථා 09 කදි විධිමත් අනුමැතියකින් තොරව ද අවස්ථා 16 ක දී නිසි අනුමැතියක් ලැබී තිබුණද අනුමත සීමාවෙන් බැහැරව ද, අවස්ථා 07 ක දී ආණ්ඩුකාරවරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ බවට සාක්ෂි නොමැති අවස්ථා ද පැවතුණි. | විමර්ශන නිලධාරීන් හා අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව විදේශ ගමන් සම්බන්ධව වැටුප් රහිත නිවාඩු දින 96 ක් හා අනුමත කර නොගත් අසනීප නිවාඩු 23 ක් වශයෙන් වැටුප් රහිත නිවාඩු 119 ක් සඳහා රු. 113,349 ක මුදලක් අයකරගෙන ඇති බව හා තව දුරටත් රු.38,364 ක මුදලක් අය කර ගත යුතුව ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමූපකාර සංවර්ධන නිලධාරියකු හෙනරත්ගොඩ සණස සමිතියේ අරමුදල් පෞද්ගලිකව අයෝජනවල යෙදවීම, ඇප තබා නොගෙන ණය ලබා දීම, සමිතියේ වත්කම් විකුණා මුදල් ලබා ගැනීම යන කරුණු හේතුවෙන් බන්ධනාගාර ගතවී තිබීම නිසා වැඩ තහනම් කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදු කිරීම සමූපකාර අමාත්‍යාංශය මගින් සිදු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගම්පහ දිස්ත්‍රික්කය තුළ සණස සමිති 25 ක් සමූපකාර ප්‍රඥප්තියට හා රීති මාලාවට පටහැනිව සමූපකාර කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව GDC සමාගමේ මුදල් ආයෝජනය කිරීම හා ණය ලබා දීම හා සමිතිවල තිබූ මූල්‍ය අක්‍රමිකතා, මූල්‍ය වංචා, දූෂණ හේතුවෙන් මූල්‍ය අර්බුදයන්ට ලක්වීම නිසා සාමාජික හා සාමාජික නොවන තැන්පත්කරුවන් 61,393 ක ගෙන් බාරගත් රු. මිලියන 6,761 ක තැන්පතු මුදල් ආපසු | සිදු වී ඇති මූල්‍ය හානි සම්බන්ධයෙන් වගකිවයුතු අයගෙන් අයකර ගැනීම සඳහා සමිති වෙත දැනුම් දීමට කටයුතු කරමින් පවතින බව හා ආයෝජනය කළ මුදල් වහාම ලබා ගැනීමට ද අදාල සමාගමේ දේපළ තහනම් කිරීමට අවශ්‍යා වන්නේ නම් ඒ සඳහා ද අවශ්‍යා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට | සමූපකාර ප්‍රඥප්තියට හා රීති මාලාවට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීමට නොහැකියාව මත ගම්පහ දිස්ත්‍රික් සණස සමිති ව්‍යාපාරය කඩා වැටී තිබුණි. මෙම අයෝජිත මුදල් හා ලැබිය යුතු පොළී ආදායම් ලබාදීම GDC ආයතනය විසින් පැහැර හැර තිබුණ ද ඒ සම්බන්ධයෙන් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | උපදෙස් ලබා දී ඇති බව. | |
| (ඉ) | කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කයන්හි සමුපකාර සමිති 5 ක සමිතිවල නිලධාරීන් විසින් සිදුකරන ලද මුදල් වංචා හා මුදල් ඌණතා වටිනාකම රු. මිලියන 338 ක් වුවද එම දිස්ත්‍රික්කයන්හි සහකාර සමුපකාර කොමසාරිස්වරු විසින් ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මූල්‍ය අලාභ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීමට, පරික්ෂණය සිදු කර නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හා පාර්ලිමේන්තුව විසින් ලබා දෙන උපදෙස් ක්‍රියා කරවීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සීමාසහිත ගම්පහ සමුපකාර සණස සමිති සංගමයේ සිදු වී ඇති රු. මිලියන 3,024 ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් අධිකරණ නියෝග ප්‍රකාරව විමර්ශනයක් සිදු කර වාර්තා කිරීමට දෙපාර්තමේන්තු නිලධාරීන් 2023 ජූලි 20 දින දක්වා වසර 03 කට අධික කාලයක් ප්‍රමාද කර තිබීම හේතුවෙන් මූල්‍ය අලාභ අයකර ගැනිමට නොහැකි වී තිබු අතර අදාළ නීතිමය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. | අදාළ පොත්පත් අපරාධ ඒකකයෙහි නඩු විභාගයට අදාළ නඩු භාණ්ඩ බැවින් පිටපත් ලබා දීමට නීත්‍යානුකූලව නොහැකි බව අපරාධ විමර්ශන අංශය දන්වා තිබුණු බව. | අධිකරණ නියෝග ප්‍රකාරව විමර්ශනය සිදුකර මූල්‍ය අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සමුපකාර ප්‍රඥප්තියට පටහැනිව ස්ථාවර තැන්පත් ලෙස රු. මිලියන 9 ක් ආයෝජනය කිරීම, නුවරඑළිය නිවාඩු නිකේතනයට කාමර දෙකක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 3 ක් ගෙවීම හා අවන්හල් ව්‍යාපෘතියක් සඳහා රු. 700,000 ක මුදලක් ගෙවීම ඇතුළු රු. මිලියන 13 ක මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් හෙනරත්ගොඩ සමිතියේ සභාපති වන සමුපකාර සංවර්ධන නිලධාරියෙකු සහ කාරක සභිකයින් 11 දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කර ඇතත් විමර්ශනය පවත්වා සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 3 ½ ක් ගතවී තිබුණද, මූල්‍ය අලාභය අයකරගෙන නොතිබුණි. | වසර 07 ක් සඳහා වන තහනම් නියෝග නිකුත් කර ඇති බව හා මූල්‍ය අලාභයන් අයකර ගැනීම සඳහා අදාළ පියවර ගැනීමට සමිතිය වෙත දැනුම් දී ඇති බව. | ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | කොළඹ දිස්ත්‍රික්කයේ මූල්‍ය අර්බුදයන්ට ලක් වි ඇති සමිති 18 ක් හා ගම්පහ දිස්ත්‍රික්කයේ මූල්‍ය අර්බුදයට ලක් වි ඇති සමිති 24 ක් නිකුත් කර ඇති ණය වටිනාකම පිළිවෙලින් රු. මිලියන 3,586 ක් හා රු. මිලියන 3,545 ක් වශයෙන් එකතුව රු. මිලියන | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 7,131 ක් වූ අතර සමාලෝචිත වර්ෂය වන විට මුළු ණය ප්‍රමාණයම අයනොවී පවතින කල්පසු ණය වීමෙන් එම සමිති උග්‍ර මූල්‍ය අර්බුදයකට ලක් වී තිබුණි. | | |
| (එ) | සී/ස ගම්පහ දිස්ත්‍රික් සණස සංගමය ඇතුළු සණස සමිති 11 ක සමිති කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩම් හා වෙනත් ඉඩම් ඇපයට තබාගෙන/ඇප තැබීමෙන් තොරව ණය ලබාගෙන තිබූ අතර, ගෙවිය යුතු ණය ශේෂය රු. මිලියන 70 ක් විය. | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.21 ශීර්ෂ අංක 123 - ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිය සමඟ ගිවිසුම්ගත වීමකින් තොරව රු. මිලියන 9 ක් වැය කර පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කර තිබුණ ද එම මෘදුකාංගය භාවිතා නොකොට 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ව්‍යාපාර නාම ලියාපදිංචි සහතික නිකුත් කිරීම් 61,351 ක් Manual System මගින් සිදු කොට තිබුණි. එමෙන්ම 2023 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23 ක නව ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් 7064 ක් පරිගණක මෘදුකාංගය භාවිතා නොකට Manual System මගින් සිදුකර තිබුණි. | 2022 නොවැම්බර් 01 දිනට පෙර දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් Manual System භාවිතා කර ඇති බව හා ගැටලු සඳහා විසඳුම් ලබා දීමෙන් පසු බොහොමයක් ආයතන මාර්ගගතව ලියාපදිංචිය සඳහා යොමු කරන ලද බව . | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපාර නාම ලේඛන ලියාපදිංචි කිරීමේ මාර්ගගත වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2022 හා 2023 වර්ෂවලදී රු. මිලියන 14 ක් වැය කර පරිගණක යන්ත්‍ර 20 ක් ස්කැනර් යන්ත්‍ර 22 ක් හා ඩොන්ගල් 04 ක් මිලදී ගෙන තිබූ අතර ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක් සඳහා ලබා දී තිබුණද ව්‍යාපාර නාම ලේඛන ලියාපදිංචි කිරීමේ මාර්ගගත පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | මේ වන විටත් මාර්ගගත පද්ධතිය මඟින් සහතිකපත් නිකුත් කිරීමට මෙම යන්ත්‍ර භාවිතා කිරීම සිදුවන බව හා ඩයලොග් ආයතනය නොමිලේ ලබා දුන් ඩොන්ගල්වල බිල්පත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගෙවනු ලබයි. | වත්කම් මිලදී ගැනීමේ අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.22 ශීර්ෂය 124 - නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවල් කුලී පනතට අනුව ගෙවල් කුලී ගැටලු විසඳීමේදී බලමණ්ඩල සභාපතිගේ නොපැමිණීම, අවශ්‍ය සණපූර්ණය නොමැතිවීම නිසා ගෙවල් කුලී පැමිණිලි 74 න් 46 ක් නොවිසඳී ඇති බැවින් බලමණ්ඩලය මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | සභාපතිගෙන් නිදහසට කරුණු විමසා ඇති බව හා 2024 පළමු කාර්තුව අවසන් වන විට පැමිණිලි 46 ක් විභාග කිරීමට නියමිතව ඇති බව. | අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.23 ශීර්ෂය 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ජයවර්ධනපුර කලාප කාර්යාලයට අයත් පාසල් අතුරින් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට අඩු පාසල් 18 ක් පැවතුණ අතර ඉදිරියේදී එම පාසල් වැසීයාමේ අවධානමක් පැවතුණි. | මෙම පාසල්වලට ආසන්නයේ ජනප්‍රිය පාසල් පිහිටා තිබීම හා ජාත්‍යන්තර පාසල් වෙත සිසුන් ඇදී යාමේ ප්‍රවනතාවය නිසා ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට හේතුවන බව. | පාසල් වසා දැමීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කැලණි කලාප අධ්‍යාපන කාර්යාලයට ස්ථාන මාරු වී පැමිණි සිටි ගුරු භවතුන් 166 කගේ පෞද්ගලික ලිපිගොනු කලාප කාර්යාලය වෙත ලැබී නොතිබුණි. ඒ වෙනුවට තාවකාලික ලිපිගොනු පවත්වාගෙන යමින් පවතින අතර ඇතැම් තාවකාලික ලිපිගොනු වසර 06 ක් ඉක්මවා තිබුණි. | පිළිගන්නා බව හා ලිපිගොනු ගෙන්වා ගැනීමට අදාළ ආයතනවලට සිහිකැඳවීම් ලිපි නිකුත් කර ඇති බව හා ගුරු භවතුන් 38 දෙනෙකුගේ ලිපිගොනු ලැබී ඇති බව. | ලිපිගොනු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2000 වර්ෂයේ සිදුකරන ලද පාසල්වල භෞතික සම්පත් පිළිබඳ සමීක්ෂණය අනුව මහරගම විද්‍යාකර බාලිකා විද්‍යාලයට අනුබද්ධිත නීලම්මහර විද්‍යාලයට අයත් අක්කර 02 රූඩ් 02 ක වපසරියකින් යුත් ක්‍රීඩාපිටිය පෞද්ගලික ක්‍රීඩා සමාජයක් විසින් පරිහරණය කරමින් පැවතුණි. | ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | නීතිමය කටයුතු කර ක්‍රීඩාපිටිය පාසලට අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

### 1.5.24 ශීර්ෂ අංක 127 - ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාම සංවර්ධන දත්ත පද්ධතියේ අඩුපාඩු යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබූ අතර, ක්‍රියාකාරී සමිති හා අක්‍රීය සමිති යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | දත්ත ද්විකරණයට ලක්ව තිබීම හේතුවෙන් එම කටයුතු ප්‍රමාදයකට ලක් ව ඇති බව. | ක්‍රියාකාරී හා අක්‍රීය සමිති හඳුනාගත හැකි පරිදි දත්ත යාවත්කාලීන කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 9,334 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 15,216 ක් විය. ඒ අනුව අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 5,882 ක පිරිහීමක් ඇති වී තිබුණු අතර එම පිරිහීම සඳහා මූලධන වියදම් පූර්ව වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 4,798 කින් වැඩිවීම හා පුනරාවර්ථන වියදම් රු. මිලියන 4,675 කින් වැඩිවීම හේතුවී තිබුණි.

## 3 කාර්ය මණ්ඩල පරිපාලනය

### 3.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමූපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 02 ක් වසර 23 කාලයක සිට ද සමූපකාර සංවර්ධන සහකාර තනතුරු 04 ක් වසර 21 ක කාලයක් සිට සහ සමූපකාර සංවර්ධන නිලධාරී හා සංවර්ධන නිලධාරී තනතුරු 80 ක් ද පුරප්පාඩුව පැවතුණි. | සියලු පුරප්පාඩු ඇති වූ අවස්ථාවේදීම වාර්තා කරනු ලබන අතර ත්‍රෛමාසිකව කාර්ය මණ්ඩල කාර්තු වාර්තා මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පිරිස් හා පුහුණු වෙත වාර්තා කරනු ලබන බව. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |

**3.2 පළාත් පාලන ආයතන**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතනවල සේවක පුරප්පාඩු 5722 ක් පැවතුණි. | පුරප්පාඩු දැන්වීම් නිසි නිලයන් මගින් අනුමැතියට යොමු කර ඇති අතර අමාත්‍ය මණ්ඩල තීරණ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර මෙතෙක් බඳවා ගැනීම් සිදු වී නොමැති බව. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |

**3.3 පාසල් කාර්ය මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 මැයි 27 දිනට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ විදුහල්පති පුරප්පාඩු 463 ක්ද ගුරු පුරප්පාඩු 3,920 ක්ද පැවතුණි. | රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින සියලුම පුරප්පාඩු කලාප මට්ටමේ නිලධාරීන් විසින් ආවරණය කරනු ලබන බව හා ගුරු පුරප්පාඩු සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම් සිදු කරනු ලබන බව. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාතට අයත් පාසල්වල අනුමත කාර්ය මණ්ඩල තුළ සංවර්ධන නිලධාරී තනතුරු 183 ක් ද, කළමනාකරණ සහකාර සේවයේ තනතුරු 07 ක් ද, විද්‍යාගාර සහකාර තනතුරු 36 ක්ද, මුරකරු තනතුරු 88 ක්ද, පුස්තකාල සහායක තනතුරු 265 ක් ද, විද්‍යාගාර සහායක තනතුරු 68 ක් හා සනීපාරක්ෂක කම්කරු තනතුරු 14 ක් පුරප්පාඩු පැවති අතර, පාසල් කාර්ය සහායක තනතුරු 42 ක් හා පාසල් කම්කරු තනතුරු 243 ක අතිරික්තයක් පැවතුණි. | පුස්තකාල සේවක සහ රසායනාගාර සේවක තනතුරුවල පවතින පුරප්පාඩු පාසල් කාර්යය සහායක සහ පාසල් කම්කරුවන් මගින් ආවරණය කරනු ලබන බව. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |

### 3.4 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 48 ක් ද තෘතීය මට්ටමේ තනතුරු 16 ක් ද ද්විතීය මට්ටමේ තනතුරු 244 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 9 ක් ද අතිරික්තව පැවති අතර පුරප්පාඩු පවතින ආයතන වෙත එකී නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින ආයතන වෙත අනුයුක්ත කළ යුතු ය. |
| (ආ) | 2023 වර්ෂය තුළ දී තනතුරුවල අතිරික්ත ලෙස කාර්ය මණ්ඩලය සිටියදීත් කොන්ත්‍රාත් පදනමින් විශ්‍රාමිකයන් 51 ක් බඳවා ගැනීම නිසා කොළඹ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් රු. මිලියන 7 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින ආයතන වෙත අනුයුක්ත කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සැලසුම් කිරීම

**ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සෑම ආයතනයක්ම තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර සකස් කළ යුතු වුවත් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | නියමිත දිනට ඉදිරිපත් කළ යුතු අතර, සංඛ්‍යාත්මක දත්ත ඇතුළත් කර ඇගයීමට ලක් කළ හැකි පරිදි සැකසිය යුතුය. |